# සිඟිතිගේ පුංචි ලේන් පවුල



තනුමි විජේසුන්දර

# සිගිතිගේ පුංචි ලේන් පවුල

## තනුමි විජේසුන්දර

- කතා-

පළමු දිගහැරුම

මහමයා බාලිකා විද්‍යාලය

30/04/2026

ISBN NO - 978-624-211-195-7

# පිදුම

හය හතර නෝතේරන

කාලයේ

පටන් ඉතා ආදරයෙන් මා

පෝෂණය කළ

ආදරණීය “අම්මාට” සහ “තාත්තාට”

ගෞරවයෙන් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව

සිහිති කියන්නේ පුංචි ගැනු ළමයෙක්.ඇය හරිම කරුණාවන්තයි,ලස්සනයි.ඇය ඇගේ අම්මයි තාත්තයි එක්ක ලස්සන ගමක පුංචි ගෙදරක ජීවත් වුණා.

පුංචි සිහිතිට දැන් වයස 9 යි.මේ සිහිති පාසල් යන්න හරිම ආසයි.මෙයා හැමදාම උදෙන්ම නැගිටලා පාසල් යන්න ලෑස්ති වුණා .මේ පුංචි සිහිති පාසල් ගිහින් ළමයි සමඟ සතුටින් ඉගෙන ගත්තා.



එක දවසක් පාසලේ ගුරුතුමිය පාඩමේ දී කුරුල්ලන්, ලේනුන් හා වෙනත් සතුන්ට කෑම කන්න පුළුවන් ආකාරයට ගෙදර පුංචි කුරුළු ලෑල්ලක් හදන්න යැයි පැවසුවා.



ඉතින් මේ පුංචි සිගිති ගෙදර ගිහින් කෑම කාලා තාත්තා සමඟ ගුරුතුමිය කියා දුන් පුංචි කුරුළු ලෑල්ල හදන්න සූදානම් වුණා.

මේ සිඟිති කුරුළු ලෑල්ල හදන්නේ හරිම සතුටින්.

කුරුල්ලන්,ලේනුන් වැනි සතුන් බඩගිනි නිවා ගන්න කෑම කන දිහා බලන් ඉන්න පුංචි සිඟිති සිහින මවමින් සිටියා.

මේ සිඟිතියි තාත්තයි ලස්සන කුරුළු ලෑල්ල හදලා ඉවරයි.ඇය ගෙය ඇතුළට දුවගෙන ගිහින් ගෙදර තිබූ රස අඹ කැබැල්ලක් හා කෙසෙල් ගෙඩියත් ගෙනල්ලා හදපු කුරුළු ලෑල්ල උඩින් තිබ්බා.

ඇය ගෙය ඇතුළට වෙලා ලෑල්ලට පලතුරු කන්න කුරුල්ලන් එන තුරු බලාගෙන හිටියා.මෙහෙම ඉද්දී ලස්සන කුරුළු රංචුවක් ඇවිත් පලතුරු කන්න ගත්තා.ලේනුන් ද පලතුරු කන්න ලෑල්ලට ආවා.සිඟිතිට හරිම සතුටුයි.



සිඟිති මේ දිහා හරි ආසාවෙන් බලා ගෙන හිටියා.ඇය හැමදාම කුරුල්ලන්ට කන්න රස පලතුරු ලෑල්ල මත තිබ්බා.කුරුල්ලන් මේ පුංචි සිඟිතිගේ ලෑල්ලට හැමදාම පලතුරු කන්න එන්න පුරුදු වෙලා හිටියා.මේ හින්දා මේ කුරුල්ලන් පුංචි සිඟිතිට හරිම ආදරෙයි.



එක් දවසක් සිඟිති ගෙවත්තේ ඇවිද ගෙන යන විට ඇයගේ ජම්බු ගහේ ජම්බු කන්න එන පුංචි ලේන් පවුලක් දැක්කා.

සිඟිති හැමදාම දවල්ට ජම්බු ගහ යටට වෙලා ලේන් පවුල දිහා බලා සිටිනවා.

එක දවසක් සිඟිති ලේන් පවුලට ලස්සන කූඩුවක් හදලා දෙන්න ඕන යැයි සිතමින් සිටියා.

එවිටම අහස අඳුරු වී තද වර්ෂාවක් ඇද හැලුණි.සිඟිති නිවසට දුව ගෙන ගොස් ජනේලයෙන් ජම්බු ගහේ සිටි ලේන් පවුල වැස්සට හොඳටම තෙමෙන විදිහ බලා ගෙන සිටියා.

ඇයට හරිම දුකයි.සිඟිති වැස්ස අවසන් වු විගස තාත්තා සමඟ ගෙවත්තේ ඇති ලී සොයන්න පටන් ගත්තා.

නිවසට ගොස් ලේන් කූඩුව හදන්න පටන් ගත්තා.



ලේන් පවුල පුංචි සිඟිතිගේ කූඩුවට එනතුරු සිඟිති බලාගෙන සිටියා.නමුත් ලේන් පවුල කූඩුවට එක පාරටම ගියේ නැහැ.ඇයට හරිම දුකයි.

ඇය හරිම ආසාවෙන් කූඩුව හැදුවේ ලේන් පවුල පුංචි සිඟිතිගේ කූඩුව ඇතුළේ සතුටින් ජීවත් වෙන හැටි බලන්න.ඇය මේ ගැන තාත්තට පැවසුවා.

“තාත්තේ අපි හදපු කූඩුව ට ලේන් පවුල ආවේ නැහැ.මට ගොඩක් දුකයි".

“පුතේ අපි හදපු කූඩුවට ලේන් පවුල ඉක්මනටම එයි.පුතා බලාගෙන ඉන්න".

“ ඇයි තාත්තේ ලේන් පවුල කූඩුවට ආවේ නැත්තේ" “එහෙම නැහැ පුතේ .ලේන් පවුල එකපාරටම එන්නේ නැහැ. ඒ දිහා හොදින් බලලා තමයි එන්නේ ඒ හින්දා පුතා දුක් නොවී ඉන්න".

“හොදයි තාත්තේ" යැයි පැවසූ සිඟිති උඩු මහලට ගියා.රාත්‍රී ආහාර ගැනීමට අම්මා සිඟිතිට කතා කළ විට සිඟිති දුකින් පහළට පැමිණ මෙසේ පැවසුවා.

“ දුව දුක් වෙන්න එපා මේ අඹ කැබලි කූඩුවෙන් තියන්න ලේන් පවුල කූඩුවට එයි".

එය ඇසූ සිගිති හරිම සතුටින් රාත්‍රී නින්දට ගියා.



සිඟිති උදෙන්ම නැගිට අම්මා දුන් අඹ කැබලි රැගෙන කූඩුව තුළ තබා ලේන් පවුල එනතුරු බලා සිටියා. නමුත් ලේන් පවුලේ අම්මා ඒ අසලට ගොස් නැවත ගියා. මෙය දුටු සිඟිති හරිම දුකෙන් අම්මා අසලට ගියා.

"අම්මේ අදත් ලේන් පවුල දවස් කීපයකින් එයි අපි බලමු" අම්මා පැවසුවා.

එක දවසක් සිඟිති පාසල් නිම වී ඇවිත් නිවසේ තිබූ පලතුරු එම කූඩුව තුළ තබා ජම්බු ගහ යටට වෙලා ලේන් පවුල පැමිණෙන තුරු බලා සිටියා. එදත් ලේන් අම්මා ඒ අසලට ගොස් ආපසු හැරී ආවා. නැවතත් සිඟිතිට ගොඩක් දුක හිතුනා.

(විනාඩි පහකින් පසු)

ලේන් පවුල කූඩුව තුළ ඇති අඹ කන්න ආවා. මේ දුටු සිඟිතිට දැන් බොහොම සතුටුයි.


පුතේ දුක් වෙන්න එපා. ඔයාගේ ඔය ලස්සන පුංචි තරුව කූඩුවට එයාලා ළඟ දී ම එයි.
හරි අම්මා

ඇය තාත්තාට කතා කළා තාත්තා දුව අසලට පැමිණියා.

“තාත්තේ අර බලන්න"

“ඒක තමයි පුතේ මම කිව්වේ දුක් නොවී ඉන්න කියා. දැන් පුතාට සතුටුයිද?"

“ඔවු තාත්තේ ගොඩක් සතුටුයි."

ඉතින් මෙහෙම දවස් ගෙවෙද්දි ලේන් පවුල සිහිතිගේ කූඩුවට පුරුදු වුණා ලේන් පවුල කූඩුවේ ජීවත් වෙන්න හුරු වුනා.

සිහිති හැමදාම දවල්ට කූඩුවට කෑම දාන්න පුරුදු වී සිටියා. සිහිති එදා ගොඩක් සතුටු වුණා. සතුටු කඳුළුද හැලුණා. මුහුණේ සිනා පිරී ඉතිරී ගියා තාත්තාටද අම්මාටද ගොඩක් සතුටුයි.



සිඟිති පාසල් යන්නේ හරිම සතුටින් එක දවසක් සිඟිති පාසල් ගිය දිනයක යහළුවන් සමග තම ගෙවත්තේ ලේන් පවුලක් ජීවත් වෙන බව පැවසුවා. ලේන් පවුල දැකගැනීමට යාළුවන්ට ආසාවක් ඇතිවුණා.

යාළුවන් සිඟිතිට මෙසේ පැවසුවා.

“සිඟිති ඔයාගේ ලේන් පවුල බලන්න අපි හරිම ආසයි. අපි අනිද්දා ඔයාගේ ගෙදර එන්නද?"

“හා යාලුවනේ එන්න. හොඳයි අපි එහෙනම් යමු පන්තියට" සිඟිති පාසල් නිමවී ගෙදර පැමිණ යහළුවන් පැවසූ දේ පිළිබඳ අම්මාට පැවසුවා. අම්මාද එයට එකඟ වුණා.

එදා දවස උදාවුනා. යහළුවන් කතා කළ ආකාරයට සිඟිතිගේ නිවසට ආවා.

සිඟිති යහළුවන් සමග ජම්බු ගහ දිහා බලන්න යන විට ලේන් පවුල කූඩුව තුළ සිටිය යාලුවන්ට අඹ කැලී ලබා දුන්නා. ඉතින් සිඟිති අඹ කැබලි කූඩුව තුළින් තැබුවා.



අනෙක් යහළුවන්ද අඹ කැබැල්ල කූඩුව තුළ තිබියදී ලේන් පවුල බිය වී ගියා. ඒ දුටු යහළුවන් අත එළියට ගෙන බලා සිටියා.

ලේන් පවුල බියෙන් අඹ කැබැල්ල අසලට ගොස් අනුභව කළා.

මේ ආකාරයටම සියලුම යාළුවන් ලේන් පවුල දිහා බැලුවා.

සිඟිතිගේ අම්මා කතා කළා.

“පුතේ යහළුවන් සමඟ කෑම කන්න එන්න යැයි පැවසුවා." සිඟිති යහළුවන් සමග කෑම මේසයට ගොස් කෑම අනුභව කළා.

සිඟිති එදා ගොඩක් සතුටු වුණා.

(දවස් කීපයකින් පසු)

ලේන් පවුලේ පැටියා සිඟිති සමග යහළු වුණා.

සිඟිති මේ ගැන අම්මාට පැවසුවා. අම්මා මෙසේ කීවා. “පුතේ අපි මේ ලේන් පවුල හොඳින් රැකබලා ගමු. කෑම ලබා දෙමු"

සිඟිති ද එයට කැමති වුණා.

එදා ඉඳන් සිඟිති හරිම සතුටින් අම්මයි තාත්තයි ලේන් පවුලයි එක්ක සතුටින් ජීවත් වුණා.

නිමි.



අපි සතුන්ව හොඳින් රැක ගමු.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්යය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN NO - 978-624-211-195-7**